ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>'බුදුන් වහන්සේ යනු සේවයේ සහ කැපවීමේ ප්‍රතිමූර්තියයි'; අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2020 මැයි 7 වන දින ගෝලීය වෙසක් සැමරුමේදී පවසයි</u>**

අද දින පැවති අතත්‍ය (virtual) ගෝලීය වෙසක් සැමරුමේදී අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා ප්‍රීතිමත් වෙසක් දිනයක් සඳහා සැමට සුබපැතුම් එක් කළ අතර එතුමා 2015 සහ 2018 වර්ෂයන්හිදි දිල්ලි නුවර සහ 2017 වසරේදී කොළඹදී පැවති වෙසක් සැමරුම් සඳහා එක් වූ බව සිහිපත් කළේය.

මෙම වසරේදී ඉන්දීය රජයේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ගෝලීය බෞද්ධ සංවිධානයක් වන ජාත්‍යන්තර බෞද්ධ සංගමය හා එක්ව ලොව පුරා සිටින අති පූජ්‍ය මහා නාහිමිවරුන්ගේ සහභාගීත්වය සහිතව අතත්‍ය (virtual) ආශිර්වාදාත්මක වැඩසටහනක් සංවිධානය කර තිබිණ. මේ වෙනුවෙන් නේපාලයේ ලුම්බිණි උයන, ඉන්දියාවේ බුද්ධගයාවේ මහාබෝධි විහාරය, ඉන්දියාවේ සාරානාත්හි මූලගන්ධිකුටි විහාරය, ඉන්දියාවේ කුශිනගර්හි පරිනිර්වාණ ස්ථූපය, ශ්‍රී ලංකාවේ ඓතිහාසික අනුරාධපුරයේ පිහිටි රුවන්වැලි මහ සෑ මළුවේ පිරිත් දේශනාව හා නේපාලයේ බෞද්ධනාත්, ස්වායම්භූ නමෝ ස්ථූපය ඇතුළු ප්‍රසිද්ධ බෞද්ධ සිද්ධස්ථානවල සිට ආශිර්වාදාත්මක වැඩසටහන් සජීවීව විකාශය කරන ලදී.

මෙම අවස්ථාව අමතමින් අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ප්‍රකාශ කළේ බුදුරජාණන් වහන්සේ සේවයේ සහ කැපවීමේ ප්‍රතිමූර්තියක් බවයි. සෑම අවස්ථාවකදීම දිවා රෑ පුරා මනුෂ්‍යත්වයේ සේවාවෙහි නිරතවන්නන් බුදුරජාණන් වහන්සේගේ සැබෑ අනුගාමිකයන් වේ. වර්තමානයේදී අප මුහුණ දී සිටින කොවිඩ්-19 ගෝලීය වසංගතයේදී අන් අයට සේවය කරන, රෝගීන්ට ප්‍රතිකාර කරන, දුගියෙකුගේ කුස පුරවන, රෝහල් පිරිසිදු කරන, මග තොටදී නීතිය සහ සාමය රැකීමට උරදෙන බොහෝ දෙනෙකු දිවා රෑ නොබලා වැඩකරනු අපට දක්නට ලැබේ. එවන් සෑම පුද්ගලයෙකුම උපහාරයන්ගෙන් පිදුම් ලැබීමට සහ ගෞරවයට පාත්‍රවීමට සුදුසු වන බව අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා ප්‍රකාශ කළේය.

බුදු දහමේ ඉගැන්වෙන අනුකම්පාව, කරුණාව, දුක් සැප දෙකෙහිදි නොසැලෙන ගුණය සහ කෙනෙකු සියලු ගුණ සහ අගුණ සමඟින් පිළිගැනීම යන සිව් සත්‍යයන් පිළිබඳව සිහිපත් කරමින් අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශ කළේ මෙම සත්‍යයන් තවදුරටත් ඉන්දියාවේ අනුප්‍රාණය වනු ඇති බවයි. ඉන්දියාව කොවිඩ්-19 අර්බුදයට මුහුණදීම සඳහා ගෙන ඇති ප්‍රවේශය පිළිබඳව සඳහන් කරමින් අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා ප්‍රකාශ කළේ "..ඉන්දියාව එරට සහ ලොව පුරා සිටින පීඩාවට පත් ඕනෑම පුද්ගලයෙකු සමඟ පරාර්ථයෙන්, කිසිදු භේදයකින් තොරව සිටින" බවයි

කොළඹ

2020 මැයි 7

*****